## පේරාදෙණිය විශ්වවිද්‍යාලය
## දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය
## කළමනාකරණය සහ සංවර්ධනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව - 2020

### I. අයදුම්පත ඉදිරිපත් කිරීම සඳහා උපදෙස්

(අ) දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රයේ නිල වෙබ් අඩවියෙන් (www.pdn.ac.lk/cdce) බාගත කරන ලද අයදුම්පතක් පමණක් භාරගනු ලැබේ. කලින් වර්ෂවල නිකුත් කරන ලද හෝ තමන් විසින් පිළියෙල කරන ලද හෝ අයදුම්පත් භාරගනු නොලැබේ.

(ආ) නම, ජාතික හැඳුනුම්පත් අංකය සහ අත්සන වැනි දත්ත අපගේ දත්ත ගොනුවට ඇතුළත් කිරීමෙන් පසුව වෙනස් කරනු නොලැබේ.

### II. ලියාපදිංචිය සඳහා අවශ්‍ය සුදුසුකම්

1. අ.පො.ස. (උසස් පෙළ) සියලු විෂයයන් සමත්වීම **හෝ**
2. අ.පො.ස. (උසස් පෙළ) විෂයයන් දෙකක් සමත්වීම සහ වසර දෙකක සේවා පලපුරුද්ද **හෝ**
3. අ.පො.ස. (සාමාන්‍ය පෙළ) සමත්වීම සහ වසර හතරක සේවා පලපුරුද්ද **හෝ**
4. අ.පො.ස. (සාමාන්‍ය පෙළ) සමත්වීම සහ අධ්‍යයන කාර්යය මණ්ඩලය විසින් පිළිගත හැකි වෙනත් සුදුසුකම් සපුරා තිබීම.

### III. ලියාපදිංචිය සඳහා අවශ්‍ය ලිපි ලේඛන

(අ) පහත සඳහන් ලිපි ලේඛන ඇමිණිය යුතුයි.

i. උප්පැන්න සහතිකය

ii. උප්පැන්න සහතිකයෙහි ඉංග්‍රීසි පරිවර්තනය (දමිළ අයදුම්කරුවන් සඳහා)

iii. ජාතික හැඳුනුම්පත

iv. අධ්‍යාපන දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද අ.පො.ස. (සාමාන්‍ය පෙළ) සහතිකය

v. අධ්‍යාපන දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද අ.පො.ස. (උ.පෙළ) සහතිකය (II. 3 හෝ 4 සුදුසුකම් සපිරූ අයදුම්කරුවන් සඳහා අදාළ නොවේ.)

vi. පාසල් හැර යාමේ සහතිකය

vii. සේවා පළපුරුද්ද පිළිබඳ සහතික

viii. ඉහත අංක i,ii,iii,iv,v,vi සහ vii ට අදාළව නමෙහි යම් කිසි වෙනසක් ඇත්නම්, සංශෝධිත උප්පැන්න සහතිකය හෝ දිවුරුම් ප්‍රකාශනය

(ඉහත දැක්වෙන i සිට vii දක්වා ලේඛන වල සහතික කරන ලද ඡායා පිටපත් දැනට රජයේ සේවයේ නියුතු ආයතන ප්‍රධානියෙකු, රජයේ පාසලක ප්‍රධානියෙකු, කොට්ඨාශයේ ග්‍රාම නිළධාරීවරයකු, සාමදාන විනිශ්චයකාරවරයකු, දිවුරුම් කොමසාරිස්වරයකු, නීතීඥවරයකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයකු, පොලීසියේ හෝ ත්‍රිවිධ හමුදාවේ අධිකාරිලත් නිළධාරීවරයෙකු, විහාරාධිපති හිමි නමක්, පූජ්‍ය පක්ෂයේ ආගමික නායකවරයෙක් හෝ රු. 22935/-x 12 ක් හෝ ඊට වැඩි හෝ වාර්ෂික ඒකාබද්ද වැටුපක් ලබන රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ හෝ ස්ථිර මාණ්ඩලික ශ්‍රේණියේ නිළධාරියකු විසින් සහතික කළ යුතුය).

IV. **අයදුම්පත සම්පූර්ණ කිරීම සඳහා උපදෙස්**

**කරුණාකාර මෙම පරිගණක අයදුම්පත්‍රය ඉංග්‍රීසි කැපිටල් අකුරින් පමණක් පුරවන්න.**

01. සම්පූර්ණ නම නිවැරදිව පිළිවෙලට වචන බෙදා ලියන්න.

| | | | | | | | | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| R | A | T | H | N | A | Y | A | K | A | | M | U | D | I | Y | A | N | S | E | L | A | G | E |
| N | I | M | A | L | | J | A | Y | A | S | U | N | D | A | R | A | | | | | | | |

02. මුලකුරු සහිත නම මෙහි සඳහන් කරන්න.

| | | | | | | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| J | A | Y | A | S | U | N | D | A | R | A | | R | M | N | | | | | | | | |

03. ඔබගේ ස්ථිර ලිපිනය සඳහන් කරන්න.

06. ඔබගේ දුරකථන අංක (නිවස සහ ජංගම) මෙහි සඳහන් කරන්න.

07. E-mail ලිපිනය ද සඳහන් කරන්න. ( E-mail ලිපිනය සඳහන් කිරීම අනිවාර්යය වේ. ඉදිරියේදී පාඨමාලාවන් පිළිබඳ තොරතුරු E-mail ලිපිනය හරහා ද දැනුම් දීමට කටයුතු කරන බැවින්, ඔබට E-mail ලිපිනයක් නොමැති නම් නව E-mail ලිපිනයක් සකස් කර හෝ අදාළ තිරුවේ E-mail ලිපිනය සඳහන් කරන්න.)

V. **අයදුම්පත් සැකසීමේ ගාස්තු (ගාස්තු ගෙවා අදාළ විස්තර සඳහන් කරන්න)**

අයදුම්පත් සැකසීමේ ගාස්තුව වන රු. 250.00 ක මුදල මහජන බැංකුවෙහි ඕනෑම ශාඛාවකින් පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රයේ ගිණුම් අංක **057-1-001-4-1338036** දරන ගිණුමට බැර කරන්න.

I. එම ගෙවීමට අදාළ දිනය සඳහන් කරන්න.

II. ගෙවීම් කරන ලද මහජන බැංකු ශාඛාව සඳහන් කරන්න.

III. මුදල් බැර කිරීමේදී බැංකුව විසින් දෙනු ලබන මුදල් තැන්පත් කිරීමේ කුවිතාන්සියේ (Cash Deposit Slip) ඔබේ නම, ජාතික හැඳුනුම්පත් අංකය, සහ පාඨමාලාවේ නම අනිවාර්යෙන් සඳහන් කල යුතුය.

මුදල් බැර කිරීමේදී බැංකුව විසින් දෙනු ලබන මුදල් තැන්පත් කිරීමේ කුවිතාන්සියේ (Cash Deposit Slip) මුල් පිටපත විභාග අයදුම්පත්‍රයෙහි අදාළ ස්ථානයේ ඇලවිය යුතුය. (ගිණුමට මුදල් බැර කිරීමෙන් අනතුරුව ඔබ වෙත දෙනු ලබන කුවිතාන්සියේ ඡායා පිටපතක් තමා වෙත රඳවා ගැනීමට වගබලාගත යුතුය).

**මුදල් ඇණවුම්/තැපැල් ඇණවුම්/චෙක්පත් මගින් කෙරෙන ගෙවීම් බාර ගනු නොලැබේ.**

VI. **අයදුම්පත් තැපල් කිරීම**

අයදුම්පත, 9’’ x 4’’ ප්‍රමාණයේ ලිපි කවරයක බහා ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරේ ඉදිරිපත් වන පාඨමාලාවේ නම පැහැදිළිව සඳහන් කරන්න.

සම්පූර්ණ කරන ලද අයදුම්පත සමග “III (අ)’’යටතේ සඳහන් ලිපි ලේඛණ අමුණා **“සහකාර ලේඛකාධිකාරී, දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය, තැ.පෙ. 43, පේරාදෙණිය.”** ලිපිනයට 2020.11.10 වන දිනට හෝ එදිනට පෙර ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

ඉහත සඳහන් උපදෙස්වලට අනුකුල නොවන හෝ නියමිත ආකාරයට සම්පූර්ණ නොකරන ලද හෝ ප්‍රමාද වී ලැබෙන හෝ අයදුම්පත් ප්‍රතික්ෂේප කෙරේ.

VII. **CDCE සමඟ තොරතුරු / පණිවුඩ හුවමාරුව**

වෙබ් ලිපිනය www.pdn.ac.lk/cdce ෆැක්ස් අංකය 081-2398206
ඊ මේල් ලිපිනය cdce@pdn.ac.lk දුරකථන අංක 081-2392218

**විශේෂ අවධානයට :-**

1. පාඨමාලා ගාස්තු **රු. 50,000.00කි.** වාරික දෙකක් යටතේ ගෙවීම් කළ හැකිය.

2. පාඨමාලා කාලය මාස 12 කි. සෙමෙස්තර (Semester) දෙකකි.

3. මෙම පාඨමාලාවේ දේශන පැවැත්වෙන්නේ සිංහල මාධ්‍යයෙන් පමණි. එහෙත් සෙමෙස්තර (Semester) අවසානයේ පැවැත්වෙන ලිඛිත පරීක්ෂණ සඳහා සිංහල හෝ ඉංග්‍රීසි යන එක් මාධ්‍යකින් පෙනී සිටිය හැකිය. දේශන සති අන්ත දින දෙකෙහිම පැවැත්වේ.

4. අයදුම්පත යොමු කිරීමට පෙර නියමිත පරිදි අයදුම්පතෙහි අත්සන තබා ඇත්දැයි පරීක්ෂා කර බලන්න.

5. පාඨමාලාවන් පිළිබඳ සියලුම තොරතුරු හා දැනුම්දීම් අපගේ නිල වෙබ් අඩවිය www.pdn.ac.lk/cdce හරහා ඉදිරියේදී දැනුවත් කරනු ලැබේ.

**සහකාර ලේඛකාධිකාරි**
**දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය**
2020-10-11